හැටන් - දික්ඔය නගර සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 20 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 3 දිනද විගණනයට විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 25 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 නොසැසඳු පාලන ගිණුම්
-----------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු විවිධ තැන්පතු ශේෂය රු.10,935,097 ක් වුවද, තැන්පතු ලේඛනය අනුව එම ශේෂය රු.8,272,691 ක් වූයෙන් රු.2,662,406 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්
---------------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 25 දක්වා කාල පරාසයකට අදාළ ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව වූ රු.14,086,415 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 9 දක්වා කාල පරාසයකට අදාළ ගෙවිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.258,245 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.28,223,519 ක් වටිනා ගිණුම් විෂයයන් 5 ක් විස්තරාත්මක උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4. නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ). නගර සභා ආඥා පනතේ (255අධිකාරිය) 36 (ඉ) (ii)වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සභාවට අයත් රූඩ් 1 පර්චස් 39.14 ක ඉඩම් කැබලි 7 ක් පුද්ගලයින් 7 දෙනෙකුට බදු දී තිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 53 කදී තැන්පත්කර තිබුණු රු.1,697,317 ක මුදලක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,050,988 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,911,167 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.19,139,821 ක වර්ධනයක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.19,139,821 ක වර්ධනයට ආදායම් විෂයන් 5 ක ආදායම් වැඩිවීම සහ වියදම් විෂයන් 2 ක වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---------------------------------------

ජංගම වත්කම් සමඟ ජංගම වගකීම් සැසඳීමේදී, ජංගම අනුපාතය: 4:1 ක් ලෙසට පැවතුණි. එමෙන්ම රු.92,195,549 ක් වූ ජංගම වත්කම් වලින් සියයට 39 ක් හෙවත් රු.36,780,132 ක් මුදල් ශේෂය වූ අතර, රු.20,200,758 ක ජංගම වගකීම් වලින් සියයට 71 ක් හෙවත් රු.14,466,331 ක් ආපසු ගෙවිය යුතු තැන්පතු විය. මෙම ආපසු ගෙවිය යුතු තැන්පතුවලින්ද සියයට 82 ක් හෙවත් රු.11,949,689 ක් පමණ ක්ෂණිකව ආපසු ගෙවිය යුතු නොවන ඒවා බැවින් වඩා වාසිදායක ලෙසට අතිරික්ත මුදල් ආයෝජනය කල හැකි බව නිරීක්ෂණය විය.

2.4. ආදායම් පරිපාලනය

-----------------------

(අ). සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබුණු ආදායම් පිළිබඳ තොරතුරු අනුව රු.6,070,136 ක හිග ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර නොතිබුණි.

(ආ). වසර 9 සිට වසර 20 ක කාල පරාසයක් තුල මස්කඩ 9 කින් අයවිය යුතුව තිබුණු රු.548,138 ක කුලී සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන නොතිබුණි. තවද සභාවේ මස්කඩයක් 2015 වර්ෂයට කුලී පදනම මත ලබාගත් තැනැත්තෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.433,346 ක හිඟ කුලී සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි.

(ඇ). සභාවට අයත් දික්ඔය උත්සව ශාලාව කුලියට දීම වෙනුවෙන් 2015 වර්ෂයට අදාලව අයවිය යුතුව තිබුණු රු.295,253 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඉ). 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය අතර කාලය තුල සභාවට අයත් ඉඩම් කැබලි 3 ක් තක්සේරු කුලියට වඩා අඩු කුලියකට බදුදීම හේතුවෙන් රු.414,660 ක බදුකුලී ආදායම් සභාවට අහිමිවී තිබුණි.

2.5 අධිභාර

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 182(1) වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාරවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.10,894 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

(අ). සභා බල ප්‍රදේශයේ දේපළ වසර 5 කට වරක් තක්සේරු කර එම තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු සංශෝධනය කර අය කළ යුතු වුවද, 2014 වර්ෂයේ අවසන් වරට දේපළ තක්සේරු ඇතත්, එය පදනම් කරගෙන වරිපනම් බදු අය නොකර 2006 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී බදු අයකර තිබුණි. මේ හේතුව නිසා සභාවට අහිමිවූ ආදායමද ගණනය කර නොතිබුණි.

(ආ). සභාවට අයත් පර්චස් 27.14 ක් වූ ඉඩම් කැබලි 3 ක කුලී නියමිත කාලයේදී තක්සේරු නොකර බදුදී තිබුණි.

(ඇ). සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මකව තිබුණු ව්‍යාපාර 49 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත්කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්.

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවැතුණි.

| | වත්කම් වර්ගය | වටිනාකම<br>රු. | නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| i. | ජුකි මැෂින් 05 ක් | 150,000 | වසර 05 ක් |
| ii. | ජුකී මැෂින් මෝටර් 05 ක් | 175,000 | වසර 05 ක් |
| iii. | මහේන්ද්‍රා ජීප් රථය | 1,300,000 | වසර 03 ක් |
| iv. | අවමංගල රථය | 8,500 | වසර 04 ක් |
| v. | මාර්ග තලනය | 1,000,000 | වසර 10 ක් |
| | | 2,633,500 | |

=======

3.3 සන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

(අ). සභා බල ප්‍රදේශයේ කසල බැහැර කිරීම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, නගරය තුල බොහෝ ස්ථානවල අවිධිමත් ලෙස කසල රැස්කර තිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම කසල කළමනාකරණය කිරීම සම්බන්ධ ව්‍යාපෘතියක් වෙනුවෙන් පාරිසරික පරීක්ෂණ වාර්තාව ලබාගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී මධ්‍යම පරිසර අධිකාරියට රු.40,000 ක් ගෙවා තිබුණද, අදාල වාර්තා ලබාගෙන නොතිබුණි.

(ආ). මධ්‍යම පළාත් සභාවේ හා නගර සභාවේ මූල්‍ය දායකත්වයෙන් රු.686,256 ක් වටිනා ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් 100 ක් හා කොන්ක්‍රීට් කසල බඳුන් 100 ක් සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණද, ඉන් රු.32,963 ක් වටිනා ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් 9 ක් සහ රු.278,400 ක් වටිනා කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් 87 ක් නිකුත් කර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

අයවැය පාලනය.
--------------------

(අ). සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 4 ක සියයට 22 සිට සියයට 170 දක්වාද, වියදම් විෂයයන් 5ක සියයට 16 සිට සියයට 53 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුලත් සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවති රු.2,050,000 ක් වූ කර්මාන්ත 6 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. පද්ධති හා පාලන.

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ). ආදායම් පරිපාලනය. | සභාවට අයවිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). ණයගැති/ ණයහිමි පාලනය. | විවිධ පාර්ශවයන්ගෙන් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට මෙන්ම විවිධ පාර්ශවයන්ට ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබීම. |
| (ඇ). වත්කම් පාලනය. | අපහරණය කළ යුතු වත්කම් අපහරණය කර සභාවට ආදායම් ලබාගැනීමට කටයුතු නොකර එම වත්කම් සභාවේ රඳවාගෙන තිබීම. |
| (ඇ). ගිණුම්කරණය. | ආපසු ගෙවිය යුතු විවිධ තැන්පතු ගිණුමේ සහ තැන්පතු ලේඛනයේ ශේෂ අතර වෙනස්කම් පැවතීම. |